# Path to Success – Study Pack

## තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# සංගීතය
# 7 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

**කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය**

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී. ඉරෝෂිනි කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**

අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**

සීතා සමරවීර - ගුරු උපදේශක

නිශානි විජේසුන්දර- ගුරු සේවය

සමන්තා අමුණුගම - ගුරු සේවය

**සියලු හිමිකම් ඇවිරිණි**

## උපදේශාත්මක ගීත රසාස්වාදය හා ගායනය

- **ජීවිතය හොඳින් හැඩගස්වා ගැනීමට අවශ්‍ය උපදේශ ඇතුළත් ගීත උපදේශාත්මක ගීත නම් වේ.**

එවැනි ගීත කිහිපයක් පහත දැක්වේ. youtube චැනලය ඔස්සේ මෙම ගීත ශ්‍රවණය කර එම ගීත මගින් කියවෙන උපදේශ සහ ගැයූ මුල් ගායක / ගායිකාවන් නම් කරන්න.

අහන්න මගෙ හොඳ පුංචි පුතේ
ඔබේ අතේ මතු අනාගතේ..

වැදූ මවත් ඔබ දිනූ බිමත් - රැක ගන්න ඔබේ ඇස් දෙක වාගේ
එපා නමන්නට අයුක්තියට හිස - යුතුකම සුරකිනු පණ වාගේ..

ඔබේ නම පතළ ව මහ වියතකු වී - තිබුණත් වස්තුව පිරි ඉතිරී
ලෝකයේ ඔබ කොයි මුල්ලක සිටියත් - මැරෙන්න ලක් දිව දෙසට හැරී..

| **උපදේශාත්මක ගීතය** | **ගායක / ගායිකාව** | **ගීතයේ ඇතුළත් උපදේශ** |
|---|---|---|
| නොමග නොයන් පුතේ | | |
| දූ පුතුනේ රට අපේය | | |
| කරුණාව සමඟ හොඳ හිත | | |
| දෑඩි කළ මාතා | | |
| හිතන්නකෝ අයියේ | | |
| සමන් වැලේ මල් | | |
| පාන් කිරිත්තා | | |

- “ල” අකුරෙන් ලියා ඇති පහත දැක්වෙන ගීතයට සුදුසු පද නිර්මාණය කරමු. “ල” කාරයෙන් මෙය කියවන්න. පසුව පද එකතු කරන්න.

| | | | |
|---|---|---|---|
| ල ල ල ල | ලා - ල ල | ලා - ල ල | ලා - - - |
| ත ද නි ල් | පා - ට ට | ඇ - ත පෙ | නේ - - - |
| ල ල් ල ල | ලා - ල ල | ල ල ල ල් | ලා - - - |
| සි ති ජ ය | න ම් හ රි | නි ස 0 ස | ලේ - - - |
| ලා - ල ල | ලා - ලා - | ලා - ල ල | ලා - ල ල |
| හෝ - හ ඩ | දී - ලා - | හෝ - හ ඩ | දී - ම හ |
| ල ල ලා - | ල ල් ල ල | ලා - - - | - - - - |
| මු හු දේ - | හ රි ස ද් | දේ - - - | - - - - |

මේ ආකාරයට තවත් ගීතයක් නිර්මාණය කරන්න.

- ගීත නිර්මාණයට යෝජිත මාතෘකා..

    වැස්ස, සුළඟ, මුහුද, අහස, හඳ, තරු....

පහත දැක්වෙන රිද්මයට ද ගීතයක් නිර්මාණය කරන්න.

| | | | |
|---|---|---|---|
| ල ල් ල | ල ල ල | ලා - ල | ලා - - |
| | | | |
| ල ල් ල | ල ල ල | ලා - - | - - - |
| | | | |
| ලා - ල | ලා - ල | ල ල් ල | ලා - ල |
| | | | |
| ල ල ල | ලා - ල | ලා - - | - - - |
| | | | |

➢ **නිවැරදි පිළිතුරු තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 1. “මාත්‍රා” යනු | / ලෙසය. |
| 2. “ආඝාතය” යනු | මැදුම් තනි තිත වේ. |
| 3. මූලික තිත් රූප ගණන | /\ ලෙසය. |
| 4. “ග්‍රහ” යනු | “විෂමග්‍රහ” වේ. |
| 5. “තිත්” සංඥාව පෙන්නුම් කරන සංකේතය වන්නේ | 3 කි. |
| 6. මාත්‍රා 2න් 2 ට ගමන් කරන තිත | තාල තැබීමවේ. |
| 7. + තම් ද \| නා ඍ ඍ \| යන පද පේළිය අයත් ග්‍රහය | කාලය මනිනා මිම්ම වේ. |
| 8. “තෙයි” සංඥාව පෙන්නුම් කරනුයේ | Off beat වේ. |
| 9. මාත්‍රා 3 න් 3 ට ගමන් කරන තිත | අල්ලා ගැනීම වේ. |
| 10. “ග්‍රහ” ප්‍රධාන කොටස් ගණන | තිත් වේ. (අප්‍රාණික හඬ) |
| 11. තලම්පටේ පියන්පත් දෙක එක මත එක තැබීමෙන් උපදින හඬ | Before the beat වේ. |
| 12. + + +/ + දු ර / පෙ නෙ න / යන ගී පාදය ඇතුලත් “ග්‍රහ” | මහ තනි තිත වේ. |
| 13. “අවග්‍රහ” යන්න අපරදිග සංගීතයට අනුව | “තෙයි” වේ. (සප්‍රාණික හඬ) |
| 14. “මිහිකත නලවාලා” යන ගීතය ගමන් කරන්නේ | “අවග්‍රහ” වේ. |
| 15. “සමග්‍රහ” යනු අපරදිග සංගීතයට අනුව | 2 කි. |
| 16. තාලම්පටේ හඬ විසිරීම | on the beat වේ. |
| 17. “සමග්‍රහ” යන්නට උදාහරණයකි | මාත්‍රා 4 න් 4 ට ය. |
| 18. මාත්‍රා 4න් 4 ට ගමන් කරන තිත | 3 කි. |
| 19. අපරදිග සංගීතයට අනුව “විෂමග්‍රහ” | වදිමු / සුගත වේ. |
| 20. තාලම්පටින් වැයිය හැකි “ධ්වනි” ගණන | සුළු තනි තිත වේ. |